**වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම - 2022/2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම

මගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 15.9 සම්බන්ධයෙන් අවධානය යොමු කරවමි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලිය නිපදවීම සම්බන්ධව, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට අනුව සමාගම විසින් නිකුත් කරන ලද මාසික ඉන්වොයිසි ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) විසින් සමාලෝචනය කර ඇති අතර, බොහෝ අවස්ථාවලදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිළිගත් මුදල, ඉන්වොයිස් කරන ලද ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි. මෙම වෙනසට බලපෑ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලය එකඟ වූ මුදල තහවුරු කර තිබුණි. 2023 මාර්තු 31 දිනට ලංවිමෙන් ලැබිය යුතු මුළු ශේෂය රු. මිලියන 110,194 කි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ ශේෂ තහවුරු කිරීමට අනුව සමාගමට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 79,382 කි. තවද, සමාගම විසින් ඉහත ලැබිය යුතු ශේෂය සඳහා රුපියල් මිලියන 12,160 ක් හානිකරණ ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණි. | එම මුදල වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම වෙත අයකර ගැනීමට ඇති හැකියාව සනාථ කිරීමට අප සතුව සියලුම නීතිමය සහ මූල්‍යමය සාක්ෂි තිබේ. විශේෂයෙන්ම වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම සහ ලංවිම අතර බලශක්ති මිලදී ගැනීම "බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම" (PPA) මගින් නීත්‍යානුකූලව පාලනය වේ. බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමෙහි දක්වා ඇති පරාමිති වලට අනුව සමාගම විසින් මාසික ඉන්වොයිසි නිකුත් කිරීමය කටයුතු කර ඇති අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගිවිසුමට විධිමත් ලෙස සංශෝධන කිරීමකින් තොරව විවිධ පරාමිතීන් යටතේ ගෙවීම් සිදු කිරීම ඉස්මතු කිරීමට අපි කැමැත්තෙමු. | ලංකා විදුලිබල මණ්ඩලය සමග ඇති මතභේදය විසඳා ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ඇති කර ගත් ඉන්ධන සැපයුම් ගිවිසුමේ 5.2.1 වගන්තියට අනුව, ඉන්වොයිසියක් ලැබීමෙන් දින හතක් ඇතුළත සමාගම විසින් ඉන්වොයිස් මුදල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතුය. කෙසේ වෙතත්, 2023 මාර්තු 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය රුපියල් මිලියන 39,794 ක් වූ අතර එම ගෙවිය යුතු ශේෂයෙන් රු. මිලියන 19,317 ක් මාස 5 කට වැඩි කාලයක් නිරවුල් නොවී ඉතිරිව පැවතුනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සමාගමෙන් පොලිය ලෙස රුපියල් මිලියන 727 ක් සමාලෝචිත වර්ෂයේදි අයකරගෙන තිබුණි. | වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ගෙවීම්, ඉන්වොයිස් කළ මුදලට වඩා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමට, මිලදී ගත් ඉන්ධන සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල් පියවීමට නොහැකි විය. සමාගම මේ කාරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට අවස්ථා කිහිපයකදීම දැනුම් දී ඇත. කෙසේ වෙතත්, තවමත් සැලකිය යුතු ප්‍රගතියක් නොමැත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟ ශේෂය සඳහා ගෙවිය යුතු පොලී මුදල ලංකා විදුලිබල මණ්ඩලයේ හිඟ ශේෂයෙන් අයකර ගන්නා අතර සමාගම වෙත අලාභයක් සිදු නොවේ. | අදාළ පර්ශ්වයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම මගින් මතභේදය විසඳීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත. | | | |
| (i) 3.1 වගන්තිය | රජය සතු සියලුම ව්‍යවසායන් තම සේවක සංඛ්‍යාව සහ වේතන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය.සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මෙම සමාගම මෙගාවොට් 300ක යුගධනවි ඒකාබද්ධ චක්‍රීය බලාගාරය හිමිකර ගැනීම සඳහා පිහිටුවන ලද තනි අරමුණක් සහිතව පිහිටුවා ඇති සමාගමකි. බලාගාරයේ සම්පූර්ණ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවෙකු විසිනි. ඒ අනුව, සමස්ත මෙහෙයුම් කටයුතු සුමටව සිදු කිරීම සඳහා සමාගම විසින් බඳවාගෙන ඇත්තේ සේවකයින් තිදෙනෙකු පමණි. ඔවුන්ගේ වේතනය වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, සුදුසුකම් සහ පළපුරුද්ද මත මෙම බඳවා ගැනීම් සිදු කෙරේ. වර්ෂය තුළ බඳවා ගැනීම් හෝ ඉල්ලා අස්වීම් සිදු නොවීය. | ඉහත අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) 3.2 වගන්තිය (vi) | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධානයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. ඒ අනුව, සමාගම 2022 දෙසැම්බර් 21 දිනැති පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව ප්‍රසාද දීමනා ගෙවිය යුතු නමුත්, සමාගම විසින් ඉහත චක්‍රලේඛයට අනුගත නොවෙමින් සමාගමේ සේවකයින් තිදෙනාට | ප්‍රසාද දීමනාව ලෙස රු. 1,850,000 සමාගමේ සියලුම විධායක කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන්නේ පැය 24 පුරාම ක්‍රියාත්මක වීම හේතුවෙන් සහ රට මුහුණ දී ඇති වසංගත සහ අනෙකුත් අර්බුදකාරී තත්ත්වයන් තුළ පවා කළ සේවය වෙනුවෙනි. | - එම - |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසාද දීමනාව ලෙස රුපියල් මිලියන 1.85ක් ගෙවා තිබුණි. තවද, ඉහත ගෙවීමට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අනෙකුත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (iii) 6.6 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී මාස පහක් (5) ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ආරම්භයේ සිටම වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි. | සමාගමෙහි මෙහෙයුම් වල විශේෂිත වූ ස්වභාවය අනුව, සමාගම එම මෙහෙයුම් අත්පොත අනුගමනය කිරීමෙන් නිදහස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළ යුතු අතර වත්මන් ක්‍රියා පටිපාටි අත්පොත අනුගමනය කිරීමට අවසර ඉල්ලා සිටිය යුතුය. | - එම - |
| (iv) වගන්තිය 7.5 | රජය සතු ව්‍යවසායයන් විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා අදාළ රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | සමාගමෙහි මෙහෙයුම් වල විශේෂිත වූ ස්වභාවය අනුව, සමාගම එම මෙහෙයුම් අත්පොතෙන් නිදහස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළ යුතු අතර වත්මන් ක්‍රියා පටිපාටි අත්පොත අනුගමනය කිරීමට අවසර ඉල්ලා සිටිය යුතුය. | - එම - |
| (ආ)2021 නොවැම්බර් 17 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය | | | |
| (i) 2.3 වගන්තිය | අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය | මෙම සමාගම පිහිටුවා ඇත්තේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබා දීමෙන් එහි කොටස් හිමියන්ට ලාභ උපයා දීම සඳහා ය. පසුගිය වසර 13 තුළ මෙම | - එම - |

| | | | |
|---|---|---|---|
| | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ වන පරිදි ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් විය. | ඉලක්කය සපුරා ඇත. එබැවින්, දැනටමත් එකඟ වී ඇති ගිවිසුම් බැඳීම් සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය නොවේ. | |
| (ii) 4.4 වගන්තිය | රජය සතු සියලුම ව්‍යවසායන් තුල අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු අතර ඔහු විගණන කමිටුව හරහා අධ්‍යක්ෂක මණ්ඩලයට පමණක් වාර්තා කල යුතුය. කෙසේ වෙතත් සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ව්‍යවස්ථාපිත විගණනය මගින් මෙම ක්‍රියා පටිපාටි සහ අයවැයට අනුකූල වීම පිළිබඳව ආවරණය වේ. සමාගමේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය පුද්ගලයන් 3 දෙනෙකුට සීමා කර ඇති අතර සමාගම වගකිව යුත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන තොග වශයෙන් මිලදී ගැනීම, රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සහ වාර්ෂික ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා පමණි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 19,437 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් මිලියන 18,811 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 626 ක වර්ධනයක් නිරීක්ෂණය විය .විදුලිබල ජනන ආදායම වැඩිවීම මේ සඳහා ප්‍රධාන හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අ. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 126 කින් ඉහළ ගොස් තිබුණි. ඊට සමගාමීව විකුණුම් පිරිවැය සියයට 153 කින් ඉහළ ගොස් තිබුණි.

ආ. සමාගමේ මූල්‍ය ආදායම සියයට 18 කින් අඩු වී ඇති අතර සමාගමේ මූල්‍ය පිරිවැය සියයට 651 කින් ඉහළ ගොස් ඇත.

## 2.3 අනුපාත විශ්ලේෂණය

අ. සමාගමේ දළ ලාභ අනුපාතය පෙර වසරට සාපේක්ෂව සියයට 43 සිට සියයට 36 දක්වා අඩු වී ඇති අතර පෙර වසරට සාපේක්ෂව ශුද්ධ ලාභ අනුපාතය සියයට 50 සිට සියයට 23 දක්වා අඩු වී ඇත.

ආ. පෙර වසරට සාපේක්ෂව හිමිකම් මත ප්‍රතිලාභය සියයට 23 සිට සියයට 21 දක්වා අඩු වී ඇත.

ඇ. සමාගමේ ජංගම අනුපාතය පෙර වසරට සාපේක්ෂව 2.9 සිට 1.8 දක්වා අඩු වී ඇත.